**මොරටුව මහානගරසභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව මහානගර සභාවේ2023දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මොරටුව මහානගර සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කලමහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙව් වූ විගණන නිරීක්ෂණය

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොරටුව මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ ගිණුම් පවත්වා ගෙන යාම සඳහා බස්නාහිර පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ අංක LGD/09/2019 හා 2019 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද ආකෘති සහ කේත අංක කිසිවක් භාවිතා කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ද ගිණුම්කරණ ප්‍රමිතියේ පරිච්ඡේද අංක 03 සහ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම් පිළිබඳ රීති අංක 84 ප්‍රකාරව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ මඟින් හඳුන්වා දෙන ලද ආකෘති භාවිතා කර 2023 ගිණුම සකස් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශයේ 2.1 යටතේ දක්වා තිබුණද, ප්‍රමිතියේ පරිච්ඡේද අංක 06 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීම, වත්කම් ක්ෂය කිරීම් සහ වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට හඳුනා ගැනීම ඒ අනුව සිදු කර නොතිබුණි. | වර්ෂය සඳහා වූ අතිරික්තයේ ස්ථාවර තැන්පත් පොළී ගලපා ඇති බව, 2023 වර්ෂයට ක්ෂයවීම් වලට අදාල වෙන් කිරීමක් සිදුවී නොමැති බැවින් ක්ෂය වීම පමණක් ගලපා | ප්‍රමිතිය ප්‍රකාරව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නොමැති බව හා එබැවින් මුදල් හා මුදල් වලට සමාන දෑ නිවැරදි මුදල සටහන් වී ඇති බව. | |
| (ඇ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.28 ප්‍රකාරව ස්ථාවර තැන්පතු පොලී ආදායම ලෙස රු.8,301,300ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කළ යුතු වුවද රු.7,373,286ක් ලෙස ගැලපීම් කර තිබුණි. | මෙම දෝෂයන් පිළිගන්නා අතර ඒවා 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කළ යුතුය. |
| (ඈ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ස්ථාවර තැන්පතු වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කළ යුතු වුවද එසේ ගැලපීම් කර නොතිබූ අතර දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.19,800,313ක් වුවද රු.26,195,386ක් ලෙස සටහන් කර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුමේ ශේෂය එයට අදාල උපලේඛනය සමඟ සැසදීමේදී රු.3,143,089ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයට පෙර වර්ෂවල තොරතුරු සොයා ගැනීම මත නිවැරදිව කිරීමට යටත්ව එම වෙනස ස්ථාවරව පවත්වා ගනිමින් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සැසදෙන ලෙස සේවක ණය ගිණුම සකස් කර ඇති බව. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද වත්කම් ලේඛණ, කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛණ, ශේෂ සනාථ කිරීම් සහ භෞතික තොග විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.94,942,794ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | හිඟ ශේෂ නිරවුල් කරමින් පවතින අතර හිඟ ලේඛණ පරික්ෂා කළ හැකි බව. | ශේෂ තහවුරුව සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i) මු.රෙ.104 (3) හා (4) | හානියක් සිදු වී දින 07කට වඩා ගතවන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ද හානිය සිදු වී මාස 03ක් ගතවීමට ප්‍රථම පූර්ණ වාර්තාවක් ද, ඉදිරිපත් කළ යුතු වුවත් සභාව සතු වාහන අනතුරු07ක්සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii)මු.රෙ. 156 | 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාද වීම මත රු.1,549,200ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර එම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කළ අතර අවසන් තීරණයක් කමිටුව ලබා ගෙන නොමැති බව. | රෙගුලාසිය ප්‍රකාරව පරීක්ෂණ කඩිනමින් නිමකර නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| | (iii)මු. රෙ. 156 | සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු.11,602,318ක් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම කරුණට අදාල පරීක්ෂණ කටයුතු සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පළාත් පාලන දෙපාර්තුමේන්තුව (බ.ප) විසින් පත් කරනු ලැබ ඇති බවත්. එබැවින් මෙම කරුණ හා සම්බන්ධ කටයුතු පරීක්ෂණ අවස්ථාවේ පවතින බව. | - එම - |
| | (iv)මු. රෙ. 189 | 1998 සිට 2003 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අයත් වටිනාකම රු.491,288ක් වූ අගරු චෙක්පත් 86ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව පෙන්වා දෙමි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවු ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188 (1) උප වගන්තියට අනුව මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගත නොහැකි ආකාරයේ ගණුදෙනුවක් වන සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී සභා අරමුදලින් පිළිවෙලින් රු.953,715ක් හා රු.1,086,807ක් වශයෙන් එකතුව රු.2,040,522ක් ගෙවීම් කර තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022ක මුදල සමලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට අදාල මුදලින් කොටසක් අයවී ඇති බව නාගරික ලේකම් විසින් නිකුත් කර ඇති ලිපිය අනුව දන්වා සිටිමි. | සභාවට අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.67,100,827ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු90,675,820. ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට මුළු හිඟය (රු) | ඇස්තමේන්තුගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනටමුළු හිඟය (රු) |
| වරිපනම් හා බදු | 213,519,600 | 211,280,756 | 142,594,779 | 300,320,232 | 213,357,880 | 2206,930,699 | 261,364,133 | 293,898,809 |
| කුලී | 10,090,400 | 13,969,315 | 11,958,248 | 2,011,064 | 5,524,400 | 10,448,312 | 6,316,645 | 4,357,667 |
| බලපත්‍ර ගාස්තු | 9,000,000 | 6,861,100 | 6,790,275 | 70,825 | 6,500,000 | 9,462,600 | 9,503,875 | 2,933,175 |
| වෙනත් ආදායම් | 1,500,000 | 6,087,002 | 6,087,002 | - | 594,000 | 669,763 | 647,957 | 678,305 |
| එකතුව | 234,110,000 | 238,198,173 | 167,430,304 | 302,402,121 | 225,976,280 | 227,511,374 | 277,832,610 | 301,867,956 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සහා ආඥා පනතේ 252(1) (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.300,320,232ක් වූ අතර රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 406කින් අයවිය යුතු හිඟය රු.99,053,321ක් විය. | රු.50,000කට වඩා හිඟ පවතින දේපළ සංඛ්‍යාව 2023.09.30 හා සැසඳීමේදී දේපළ 431 සිට දේපළ 406 දක්වා අඩු කරගැනීමටත් එම දේපළ වලට අදාළ හිඟය වන රු.105,048,972.00 සිට රු.99,053,321.00 දක්වා අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 ජනවාරි 01 වන දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.293,898,809ක් වුවද ඉන් රු.73,939,630ක් හෙවත් සියයට 25ක් සමලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණද රු.219,959,179ක් හෙවත් සියයට 75ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ජංගම සේවාවන් මඟින් වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | - එම - |
| (ඇ) | රජයේ ආයතන 264කින් 2023 දෙසැම්බර් 31 දිනට වරිපනම් ලෙස රු.43,116,235ක් අයවිය යුතුව පැවතුණි. | අදාල රාජ්‍ය ආයතන වෙත ලිඛිතව දැනුවත් කර හිඟ මුදල් අයකර ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග ඉටු කිරීමේ කටයුතු කරන බව . | - එම - |
| (ඈ) | සභා බල ප්‍රදේශයේ සැහැල්ලු කසළ එකතු කිරීම වෙනුවෙන් ගාස්තු නොගෙවන ආයතනවලින් 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු.56,514,058ක ගාස්තු අතුරු ව්‍යවස්ථාව අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සැහැල්ලු කසළ ඉවත් කිරීම වෙනුවෙන් අය විය යුතු කසළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පානදුර ප්‍රාදේශීය සභාවේ කසළ, කරදියාන කසළ අංගනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2013 සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව එම සභාවෙන් ලැබිය යුතු (බදු සහිත) රු.1,297,188ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බස්නාහිර පළාත් සභාවේ මැදිහත් වීමෙන් මේ සඳහා විසඳුමක් ලබා ගැනීම සඳහා කටයුතු යොදමින් පවතින බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 254 (අ) 1 සහ 2 වන වගන්ති අනුව මහා නගර සභාවට අයවිය යුතු කුලී අයකර ගත යුතු වුවත් දීර්ඝ කාලීන බදු දෙන දේපළ 179කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ශේෂය රු.5,303,156ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (උ) | දීර්ඝ කාලීන බදු දෙන දේපළ වලින් 2023 දෙසැම්බර් 31 දිනට වාරික 10ට වැඩි හිඟ හිටි දේපළ සංඛ්‍යාව 50කින් රු.3,616,450ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.7,874,293ක ලැබිය යුතු ආදායම් ශේෂ 06ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |

**2.2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර 02ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.760,173ක් අයකර ගෙන නොතිබුණි. | මුද්දර දීමනා වලට අදාලවඑම ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව හා වැඩ බැලීමේ වැටුප් වලට අදාලවමොරටුව නගර සභාවේ හිටපු සභාපති, හිටපු උප සභාපති, හිටපු ලේකම් හා හිටපු වැඩබලන අභ්‍යන්තර විගණන නිලධාරී මියගොස් ඇති බැවින් ඒ බව දන්වා ජාතික විගණන කාර්යාලයට යැවීමට කටයුතු කරන බව හා ඉතිරි රු.17,875/-ක මුදල හිටපු අභ්‍යන්තර විගණන නිලධාරිගෙන් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් මාණ්ඩලික නිලධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදය (Secret Password) ව්‍යාජ ලෙස භාවිතා කර පොදු මුරපදය (Common | තොරතුරු සනාථ කර කඩිනමින් වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර විගණන අංශය මඟින් කටයුතු කරන බව. | පරීක්ෂණ කඩිනමින් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | Password) භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10කදී රු.105,893ක් වටිනා බිල්පත් අවලංගුකර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලාභය අයකර නොතිබුණි. | | |
| (ආ) | මන්ත්‍රීවරයකුගෙන් අයවිය යුතු හිඟ ඉන්ධන ශේෂය වූ රු.75,000ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රු.29,688,127ක වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2019 නොවැම්බර් 08 දින ස්ථිර කරන ලද සේවකයින් 112 ක් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැති බැවින්, වාර්ෂිකව ගෙවන වැටුප් හා දීමනා මුදල ප්‍රතිපූරණය නොවන බව. | වැටුප් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම්අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මාර්තු 18 දින සභාව වෙත ලැබී තිබුණු ගිනි රථය 2023 දෙසැම්බර් 31 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබූ අතර, 2006 මාර්තු 22 දින සභාව වෙත ලැබී තිබුණු ටැංකි සහිත ගිනි නිවන රථයද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගිනි නිවන රථය පවරා ගැනීමට හා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලුනාව තානායම පිහිටා තිබූ සභාව සතු හෙක්ටයාර් 0.7063ක් විශාල ඉඩම රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරය 454) 06 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කිසිදු ගෙවීමකින් තොරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත 2021 දෙසැම්බර් 06 වැනි දින පවරා තිබුණි.<br>ඒ අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් එහි මහල් නිවාස සංකීර්ණයක් ඉදිකර එම නිවාස මහජනතාව වෙත අළෙවිකර තිබුණි. නිවාස 175ක ජනතාව නගර බල ප්‍රදේශයේ පුරවැසියන් වුවද ,මෙම නිවාස සඳහා වරිපනම් තක්සේරු කර අංක ලබා දී වරිපනම් අයකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් නගර සභාවෙන් සපයා නොමැති අතර, සභාවට ලැබිය යුතු විශාල වරිපනම් ආදායමක් ද අහිමි වී තිබුණි. | රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනිමින් මෙම ඉඩම සඳහා වන්දි මුදල වන මිලියන 102 ක මුදල (රජයේ තක්සේරු මුදල) ගෙවීමට අමාත්‍ය මණ්ඩල සංදේශ 2ක් මඟින් තීරණය කළ ද මෙතෙක් වන්දි ගෙවීමක් සිදු වී නොමැති බවත්. අදාළ වරිපනම් අංක නිකුත් කිරීමට වන ඉල්ලීම් භාර ගැනීමට, නව අයිතිය ලේඛනගත කිරීමට සහ අයිතිය පිළිබඳ සහතික/ නොපරවා ගැනීමේ සහතික නිකුත් කිරීමට කටයුතු කර නොමැති බව හා නීති උපදෙස් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති නිලධාරින්ගෙන් ලබා ගැනීමට කටයුතු කරන බව. | වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් සැපයිය යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 සැප්තැම්බර් 01 දිනැති මහා සභා තීරණයක් මත කාර්ය මණ්ඩලය වෙත නිල ඇඳුම් දීමනා ලෙස 2022 වර්ෂයේදී රු.3,515,000ක් ගෙවා තිබියදී 2023 ජනවාරි 10 දින රු.2,289,600ක මුදලක් ගෙවාපුද්ගලික ආයතනයකින් මිලදීගෙන 2022 ජුනි 03 දිනගබඩාවට ලැබී තිබුණු ටී ෂර්ට් 864ක් හා බොටම් 800ක් මිලදී ගැනීමට සභා තීරණයක් විගණනයට නිරීක්ෂණය නොවූ අතර, 2024 ජනවාරි 31 දින වන විටත් එම නිල ඇඳුම් තොගය බෙදා නොහැර ගබඩාවේ ගොඩගසා තිබුණි. තවද 2023 වර්ෂයේදීද රු.3,390,000ක් ඒ සඳහා ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | එන්ජිම අළුත්වැඩියා නොකිරීම නිසා වාහන 11ක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර එම වාහන දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි. | අදහස් දක්වා නොමැත | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලක්ෂපතිය ප්‍රදේශයේ ළමා හා මාතෘ සායන ගොඩනැගිල්ලේ උඩුමහල නිෂ්කාර්යව පැවති අතර, ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයට අයත් වීර පුරන් අප්පු රථගාලෙහි වැඩ අවසන් කර 2020 මාර්තු 13 දින සභාව වෙත ලිඛිතව භාරදී වර්ෂ 3 ½ ක් ගත වී ඇතත්, රථගාල බඳු දී ප්‍රදේශයේ ජනතාවට වාහන නැවැත්වීමේ පහසුකම් සලසා දෙමින් සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2020 වර්ෂයේදී ඉදිකරන ලද උතුරු මොරටුමුල්ල සිරි සාසනවංශ අනුස්මරණ පුස්තකාලය හා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සහිත දෙමහල් ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනය ගෙන නොතිබූ අතර, එය දිරාපත් වෙමින් පැවතිණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතියට යටත්ව ප්‍රතිපාදන වෙන් වූ පසු සම්පූර්ණයෙන් කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් සෑදීමට යෝජනා වී ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඩික්සන් ජේ පීරිස් ක්‍රිඩාංගණයේ ක්‍රීඩා මණ්ඩප ගොඩනැගිල්ල අබලන්ව පැවති අතර, එයට යාබදව ඉදිකර ඇති ළමා උද්‍යානය ද නිශ්කාර්යව පැවතුණි. | ඩික්සන් ජේ පීරිස් ක්‍රිඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් භාවිතයට සුදුසු නොවන බවට වාර්තාවක් ලබා දී ඇත.එය ඉවත් කිරීමට සහා නව ගොඩනැගිල්ලක් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජිතව ඇති බව. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගනයේ පැරණි ක්‍රීඩා මණ්ඩප ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයේ පැවති අතර, නව ක්‍රීඩා මණ්ඩප ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ නව ක්‍රීඩා ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය මඟින් විධිමත් පරිදි ඉදිකර නොතිබීම නිසා මහා නගර සභාව භාරගැනීමක් කර නොමැති බවත්, පැරණි ගොඩනැගිල්ල නවීකරණය මීට ඉහතදී කර ඇති වුවද මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් බහුලව මෙම ප්‍රදේශයේ ගැවසෙන බැවින් ඔවුන්ගෙන් නිතරම අලාභහානි වලට භාජනය වීම නිසා ආරක්ෂක අංශය යෙදවීමෙන් පසු නවීකරණය සුදුසු බව. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | විල්ලෝරාවත්ත ක්‍රිඩා මණ්ඩප ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවති අතර, එහි අබල් ද්‍රව්‍ය ගොඩගසා තිබුණි. | විල්ලෝරාවත්ත පැරණි ක්‍රීඩා මණ්ඩපය කීපවිටකදී ශුද්ධ පවිත්‍ර කළද ක්‍රීඩා සමාජ භාවිතයට නොගැනීම මත අවට ප්‍රදේශවාසින් විසින් විවිධ කාර්යයන් වලට යොදා ගෙන ඇති අතර ආරක්ෂක අංශ යෙදවීම සුදුසු වන බැවින් දැනට නවීකරණ කටයුතු සඳහා යෝජනා වී ඇත. | -එම- |
| (ඌ) | අඟුලාන ආදාහනගාරයේ යන්ත්‍රය දිර්ඝ කාගයක සිට භාවිතා කළ නොහැකි මට්ටමේ පැවති අතර, අළුත්වැඩියා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ තහනම් කළ 05 දෙනෙකුගේ රු.238,903ක් ද, මියගිය හා විශ්‍රාම ගිය නිළධාරින් 22 දෙනෙකුගෙන් රු.445,578ක් ද වශයෙන් එකතුව රු.684,481ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුළත් නිලධාරින් 104 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.1,565,677ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාහන ධාවනය සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතු වුවද සභාව වාහන 20ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. |
| (ආ) සභාව විසින් පරිහරණය කරනු ලබන රථ වාහන 09 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 වර්ෂයේදී බාහිර ගරාජයකට යොමු කර තිබූ ට්‍රැක්ටර් රථ 02 ක් 2024 ජනවාරි 30 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහා යහපාලනය**

**4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, සභාව විසින් 2023 වර්ෂය සඳහා රු.38,835,132ක් ඇස්තුමේන්තු කර සකස් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවේ 2023 වසරේ අයවැය ලේඛනය මඟින් මුළු ප්‍රාග්ධන වියදම් සඳහා රු.195,048,100ක් ඇස්තමේන්තු කර තිබුණ ද එම වියදම රු.50,124,251ක් වුයෙන් ප්‍රතිපාදන භාවිතය සියයට 26ක් පමණක් විය. | 2023 වර්ෂයේ මහා සභාව විසිරවීමෙන් පසු දේශපාලන අධිකාරිය විසින් යෝජනා කළ වැඩ සටහන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කළ පරිදි සිදු නොවුණු බව. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |